# ෆාහියන් හිමියන්ගේ ලංකාගමනය සිදු වූයේ කවදා ද?

**මදුරාවල සෝභිත හිමි**[1]

චීනයට බුදුදහම ලැබීමෙන් පසුව බොහෝ චීන භික්ෂූන් වහන්සේ බෞද්ධ පොත්පත් රැගෙන යාමට හා බෞද්ධ සිද්ධස්ථාන වන්දනාව සඳහා මධ්‍ය ආසියාතික ප්‍රදේශ හරහා භාරතයට පැමිණීමට උනන්දු වූහ. මුල් අවධියේදී ම එම කර්තව්‍ය සාර්ථකව ඉටුකරගත් භික්ෂුවක් වශයෙන් ෆාහියන් හිමි හැඳින්විය හැකිය. ෆාහියන් හිමියන්ගේ වාර්තාව මගින් ලාංකීය ඉතිහාසය මෙන් ම ථේරවාදී බුදුසමයෙහි ඉතිහාසය ගොඩ නැගීමටත් ලැබෙන්නේ මහඟු පිටුබලයකි. මේ නිසාම උන්වහන්සේ පිළිබඳව මෙරට විද්වතුන්ගේ හා පර්යේෂකයන්ගේ විශේෂ අවධානය යොමු වී ඇත.
චීන ජාතික ෆාහියන් හිමියන් ලංකාවට පැමිණි වර්ෂය පිළිබඳව ලාංකික විද්වතුන් හා පර්යේෂකයන් තම තමන්ගේ ප්‍රකාශනයන්හි දී අවිනිශ්චිත දින වකවානු ප්‍රකාශ කර තිබෙන අතර නිශ්චිත දින වකවානු පිළිබඳව අදහසක් ඍජුවම ප්‍රකාශ කිරීමට මැලිකමක් දක්වා ඇත. එයට ප්‍රධාන හේතුව ලෙස දැකිය හැක්කේ ඔවුන් බෙහෙවින්ම චීනයෙන් පරිබාහිර බුද්ධිමතුන් විසින් පරිවර්තනය කරන ලද මූලාශ්‍ර ද මත පදනම්ව තමන්ගේ අදහස් ඉදිරිපත් කිරීමට යෑම ය.

මෙම ගැටලුව නිරාකරණය කිරීම සඳහා මෙහි දී උත්සාහ ගන්නේ චීන ප්‍රාථමික මූලාශ්‍රය පරිශීලනය කිරීමෙනි. ඒ අනුව ෆාහියන් හිමියන් සහ උන්වහන්සේගේ චාරිකාව මෙන්ම එතුමාගේ කාර්ය භාරය පිළිබඳව සමකාලීන චීන ඓතිහාසික මූලාශ්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ. එපමණක් ද නොව මෙහි දී විශේෂයෙන් ම චීන භාෂාවෙන් සංගෘහීත පර්යේෂණ වාර්තාවන් ද සැලකිල්ලට භාජන වේ. ඒ සියලු දත්තයන් උපයෝගි කර ගනිමින් අදාළ දිනවකවානු නිශ්චිතව මෙන් ම වඩාත් සාර්ථකව ද ඉදිරිපත් කිරීමේ අරමුණින් මෙම පර්යේෂණ පත්‍රිකාව සැකසේ .

**ප්‍රමුඛ පදඃ** ෆාහියන් චීන ශ්‍රී ලංකා සබඳතා බුදු දහම
**Title:** Date of Fa-hsien's Visit to Sri Lanka
**Keywords:** Fa-hsien, China Sri Lanka relations, Buddhism

---

[1] ඉතිහාස අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
Email: sobhitham@yahoo.com